දිවි අහිමි කරගැනීම් කෙතරම් දුරට සමාජ ගැටළුවක් බවට පත්ව තිබෙන්නේද යන්න, දිවි අහිමි කරගැනීම් සම්බන්ධ සංඛ්‍යාලේඛන විමසීමේදී පෙනී යයි. ලෝක සෞඛ්‍ය සංවිධානය සඳහන් කරන්නේ එක් වසරක් තුළ ලොව පුරා සාමාන්‍යයෙන් 800,000 පමණ පුද්ගල ප්‍රමාණයක් දිවි අහිමි කරගැනීම් ඔස්සේ මිය යන බවත්, එම සෑම දිවි අහිමි කරගැනීමකටම දිවි අහිමි කරගැනීමට තැත් කිරීම් ගණනාවක් සිදුවන බවත් වේ. දිවි අහිමි කරගැනීම් වසංගතයක් ලෙසින් පැතිර යෑමේ හැකියාවක් ඇති බවද පර්යේෂණ මගින් පෙන්වා දෙයි. දිවි අහිමි කරගැනීම් සම්බන්ධයෙන් වාර්තා කිරීමේදී මාධ්‍ය මගින් විශේෂ ප්‍රවේසමක් සහ මාධ්‍ය ආචාර ධර්මයන්ට අනුකූල වීමක් අවශ්‍ය වන්නේද ඒ හෙයිනි.

ඊට උදාහරණයක් ලෙසින් පහත පුවත් වාර්තාවන්හි දිවි අහිමි කරගැනීම් පිළිබඳ ආචාර ධර්මයන් උල්ලංඝනය වී ඇති අයුරු දැක්විය හැක.

දිවි අහිමි කරගත් පුද්ගලයා ලියූ ලිපි ආදිය පළ නොකළ යුතු යැයි ආචාර ධර්මයන්හි දැක්වෙන්නේ, ඒ ඔස්සේද තවත් අයෙකුට දිවි අහිමි කරගැනීමට වක්‍රාකාරී අනුබලයක් ලැබිය හැකි නිසායි.

උපකාරක අංක සඳහන් කිරීම දිවි අහිමි කරගැනීම් වාර්තාකරණය සඳහා අත්‍යාවශ්‍ය වනු ඇත්තේ, ඒ ඔස්සේ දිවි අහිමි කරගැනීමේ නැඹුරුවක් ඇති තවත් අයෙකුගේ ජීවිතයක් බේරාගැනීමට ඉඩක් තිබෙන නිසායි.

මෙහි දිවි අහිමි කරගෙන ඇති ආකාරය අදාළ සෙබළාගේ රාජකාරිය හා සම්බන්ධ වන නිසා, එය මහජන ලැදියාවට අදාළ විය හැක. නමුත් එය අප විසින් ආවරණය කොට ඇත.

මූලාශ්‍ර: https://www.who.int/news-room/fact-sheets/detail/suicide

https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...

https://media.samaritans.org/.../Samaritans_Media...

හදිසි උපකාරක අංක:
*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ -0112696666
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926

**#MediaEthicsSL #lka #SinhalaPress#Mawbima #Lankadeepa**